www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජ න්‍යායඥ ආන්ද්‍රෙ ගෝස් 84 වන වියේදී මිය යයි

## Social theorist André Gorz dies, aged 84

**ස්ටෙෆාන් ස්ටෙයින්බර්ග් විසිනි**
**2007 ඔක්තෝබර් 9**

ආර්ථික විද්‍යාඥ හා සමාජ න්‍යායඥ 84 හැවිරිදි ආන්ද්‍රෙ ගෝස් පැරීසිය අසල පිහිටි සිය නිවසේ දී ඔහුගේ බිරිය ද සමගින් සැප්තැම්බර් 24 දා දිවි නසා ගත්තේ ය. ගෝස්ගේ ප්‍රියාදර බිරිය වූ ඩොරීන් දීර්ඝ කාලීනව රෝගයකින් පෙලීම හේතුවෙන් දෙදෙනාගේ ම ජීවිතය එකවර අවසන් කරගැනීමට එම දෙදෙනා ගිවිසුමකට එලැඹ තිබුනි.

විසිවන ශතවර්ෂයේ අවසාන භාගයේ දශක ගනනාවක් පුරා ධනේශ්වර සමාජය තුල ශ්‍රමයේ හා කම්කරු පන්තියේ භූමිකාවට අදාල න්‍යායයන් විස්තාරනය කිරීමේ දී ගෝස් කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කලේ ය. විශේෂයෙන් ම, ගෝස් 1980 දී පලකල *කම්කරු පන්තියට ආයුබෝවන්* නම් කෘතිය මගින් සමාජ ප්‍රගමනය සඳහා බලවේගයක් ලෙස කම්කරු පන්තිය ප්‍රතික්ෂේප කරනු ලැබිම, යුරෝපීය ඊනියා "නව වාම" ස්ථරයන් විසින් උද්යෝගයෙන් වැලඳගනු ලැබූ අතර බටහිර යුරෝපීය වෘත්තීය සමිති සහ හරිත ව්‍යාපාර සමහරක් විසින් ඉස්මත්තට දමන ලද ප්‍රතිපත්තීන්ගේ න්‍යායික පදනම බවට ඔහුගේ න්‍යායන් පත්විය.

1923 දී ජෙරාඩ් හෝස්ට් නමින් වියානාවේ උපන් ගෝස් කතෝලික මවක් සහ යුදෙව් පියකුගෙන් සමන්විත ඉරිතැලුනු, අසන්තෝෂයෙන් පිරි පවුලක ඇති දැඩි විය. ඔහුගේ යුදෙව් සම්භවයන් සැඟවීම පිනිස ඔහුගේ නම ගෝස් ලෙස වෙනස් කරනු ලැබුවේ මව විසිනි. කුඩා ළමයෙක් ලෙස තම අසතුටුදායක ළමාකාලයේ අර්බුදය විසඳගැනීම සඳහා ප්‍රථමයෙන් වයස 12 දී දැඩි කතෝලික භක්තියට ද ඊට යන්තම් අවුරුද්දකට පසු නාසිවාදය සමග කෙටි ලබැඳියාවක් ද වසයෙන් ලහි ලහියේ නිරතවුනු සමාගමයන් මාලාවක් තුලින් ම ඔහු විසඳුම් සෙවීය.

තරුනයකු ලෙස ස්විට්සර්ලන්තයට පැමිනි ගෝස්ට 1946 වසරේ ලෝසේන් හි දී ප්‍රංශ දාර්ශනික ෂෝන් පෝල් ෂාත්‍රෙ මුන ගැසිනි. දෙවන ලෝක යුද්ධාවසානයේ දී සිදු වූ ගෝස්ගේ ප්‍රංශ සංක්‍රමනයට හේතු වූ එක් මූලික සාධකයක් වූයේ ෂාත්‍රෙගේ රචනයන් කෙරෙහි ඔහු තුල පැවති දැඩි ඇල්මයි. පශ්චාත් යුද යුරෝපා කම්පනයන් මධ්‍යයේ සහ ජර්මනියේ මෙන් ම ප්‍රංශයේ ද ෆැසිස්ට්වාදීන් විසින් සිදුකරන ලද සංහාරයන් වඩ වඩා හෙලිදරවු වන කොන්දේසි යටතේ හිටපු යුවෙව්වකු මෙන් ම හිටපු ඔස්ට්‍රියානු ජාතිකයෙකු ද වූ ගෝස්, ෂාත්‍රෙගේ දර්ශනවාදයේ ශූන්‍යවාදී ගුනයන් තුල සැනසීම සොයා ගත්තේ ය. තනිපුද්ගලයා හට අබාධිත නිදහස පිලිබඳ පොරෙන්දුව දරාසිටි ෂාත්‍රෙගේ සාංදෘෂ්ටිකවාදී දර්ශනය තරුන බුද්ධිමතාට ආයාචනා කල අතර එම බුද්ධිමතා 1958 දී පලකල *කැරලිකරුවා* නම් ස්වයං චරිතාපදානමය කෘතියේ දී තමන්ව විස්තර කලේ "ලෝකය විසින් ප්‍රතික්ෂේප කරන ලද ශූන්‍යත්වයක්" ලෙස යි.

ෂාත්‍රෙ සමග සමීපව කටයුතු කරමින් පශ්චාත් යුද ප්‍රංශයේ ලේඛකයෙකු හා පුවත්පත් කලාවේදියෙකු ලෙස ගෝස් තම වෘත්තීය ජීවිතය ඇරඹීය. 1954 දී *නව්‍ය නිරීක්ෂකයා* නම් බලගතු ප්‍රංශ සඟරාවේ සම-ආරම්භකයා වූ ගෝස් 1961 දී ෂාත්‍රෙගේ *නව යුගය* සඟරාවේ දේශපාලන අධ්‍යක්ෂ තනතුර භාර ගත්තේ ය.

ෂාත්‍රෙ සහ අනෙකුත් බොහෝ පශ්චාත් යුදකාලීන ප්‍රංශ බුද්ධිමතුන්ගේ මෙන් ම ගෝස්ගේ ද දේශපාලන පරිනාමය සිදුවූයේ වාමාංශයේ බලගතු ම පක්ෂය වූ ප්‍රංශ කොමියුනිස්ට් පක්ෂයේ (ප්‍රකොප) අනුග්‍රහය යටතේ ය. 1946 දී පැවැත්වූ යුද්ධයට පසු ප්‍රථම ව්‍යවස්ථාදායක මැතිවරනයෙන් ඉහල ම ඡන්ද ප්‍රතිශතය වූ සියයට 28.6 ලබා ගත්තේ ප්‍රකොපය යි. ඕනෑම බුද්ධිමතෙකුගේ අවසාන අභිප්‍රාය වන්නේ ප්‍රකොප සමග සම්බන්ධ වීම බව *කැරලිකරුවා* කෘතිය තුල ගෝස් ප්‍රකාශ කලේ ය.

1956 දී රුසියානු යුද ටැංකි හංගේරියානු කම්කරුවන්ගේ නැගිටීම තලා දැමීමෙන් පසුව ෂාත්‍රෙගේ මෙන් ම ගෝස්ගේ ද කොමියුනිස්ට් පක්ෂය කෙරෙහි වූ උද්යෝගය හීන වී ගියේ ය. එහෙත් 1920 ගනන්වල දී රුසියාවේ ස්ටැලින්වාදය ඉස්මතුවීමෙන් සහ ප්‍රකොප මත මොස්කෝව දැරූ ආධිපත්‍යයෙන් කිසිදු අතිමූලික පාඩමක් උකහා ගැනීමට ගෝස් සහ ෂාත්‍රෙ යන දෙදෙනා ම අසමත් වූහ. වඩ වඩා ඊනියා තුන්වන ලෝකය දෙසට හැරුනු ෂාත්‍රෙ, ෆිඩෙල් ක්‍රස්තෝ, හෝ චි මින් සහ මා ඕ සේතුං "අධිරාජ්‍ය විරෝධී" දේශපාලනයේ භූමිකා මොඩලයන් ලෙස හුවා දක්වද්දී,

ගෝස් ප්‍රථමයෙන් කලේ 1964 දී ශ්‍රමයට මූලෝපායක් නම් කෘතියක් පලකරමින් බටහිර රටවල වර්ධනය වුනු කම්කරු පන්ති ව්‍යාපාරයට ඊනයා "විප්ලවවාදී ප්‍රතිසංස්කරන" නම් මූලෝපාය සූත්‍රගත කර දීමයි.

කම්කරු පන්තියට නායකත්වය දීම සඳහා ගොඩනගන ලෙනින්වාදී වර්ගයේ පක්ෂයක් පිලිබඳ ඕනෑම අදහසක් තමන් මුලුමනින් ම ප්‍රතික්ෂේප කරන බව ගෝස් පැහැදිලි කලේ ය. ඒ වෙනුවට ඔහු, 1960 ගනන් මැද භාගයේ දී තම ස්වයං-ප්‍රකාශිත විප්ලවීය ප්‍රතිසංස්කරන සඳහා කම්හල් තුල සහ වෘත්තීය සමිති මත පීඩනය යොදන නිපුන කාර්මිකයන්ගේ "නව කම්කරු පන්තියක්" සොයා ගති. වසර තුනකට පසුව 1967 දී පලකල *සමාජවාදය සහ විප්ලවය* නම් කෘතියේ දී මෙම ප්‍රතිසංස්කරනවලින් තමන් අදහස් කරන්නේ කුමක් ද යන්න ඔහු ප්‍රකාශ කලේ ය.

ඔහු මෙසේ ලියයිඃ "සමහරවිට ආරම්භය පරිමානිත ප්‍රතිසංස්කරන මාලාවක් විය හැකි එහෙත් දිගහැරෙනවිට අඩු හෝ වැඩි වසයෙන් ප්‍රචන්ඩ වන සමහරුන්ට හිමිවෙද්දී සමහරුන්ට අහිමිවන ශක්තිමත් අත්හදා බැලීම් මාලාවක් වන්නා වූ ද එහි ප්‍රතිඵලය කම්කරු පන්තියේ සමාජවාදී අධිෂ්ටානය සහ විඥානය හැඩගස්වීම හා සංවිධානය කිරීම වනු ඇත්තා වූ හිතාමතා කරන දීර්සකාලීන ක්‍රියාවකින් පමනක්" සමාජවාදය කැටුව එනු ලැබිය හැකි ය.

කම්හල් මත කේන්ද්‍රගත වූ ප්‍රතිසංස්කරන පිලිබඳ ගෝස්ගේ ඇනවීම කම්හල් තුල කම්කරුවන්ගේ ස්වයං-පාලනය ඉල්ලාසිටි අරාජිකවාදී වර්ගයේ ව්‍යාපාරයක් වූ ප්‍රංශ ඔටෝජෙෂන් ව්‍යාපාරයේ ප්‍රමුඛ මූලිකාංගයක් බවට පත්විය. පුලුල් දේශපාලන ප්‍රශ්නවල වියදමෙන් කම්හල් ඇතුලත සටන්කාමීත්වය මත යෙදූ මෙම අවධාරනය, 1968 පැරීසියේ ශිෂ්‍යයන් හා කම්කරුවන්ගේ විප්ලවවාදී ව්‍යාපාරය සමයේ ප්‍රකොප විසින් ඉටුකල ද්‍රෝහී භූමිකාවෙන් අවධානය ඉවතට හැරවීමේදී වැදගත් ක්‍රියාකලාපයක් ඉටු කලේ ය.

1968 දී ප්‍රකොපයේ පාවාදීම හේතුවෙන් ප්‍රංශ ධනවාදය ප්‍රතිස්ථාපනයවීමෙන් පසුව ධනේශ්වර සමාජයේ වර්ධනය පිලිබඳ තම විශ්ලේෂනය අලුත් කල ගෝස් තම න්‍යායන් සංශෝධනය කලේ ය. 1970 ගනන්වල දී ගෝස් වඩ වඩා පාරිසරික ව්‍යාපාරය වෙතට ද විශේෂයෙන් ම මධ්‍යගත අධ්‍යාපනය සහ තනි පුද්ගලයාගේ නිදහස පරදුවට තබා පරිභෝජකවාදය සහ නිෂ්පාදනය මත එහි නියුක්තිය ඇතුලත් නවීන සංස්කෘතියේ බොහෝ අංශවලට තමන්ගේ ම පුලුල් ප්‍රහාරය දියත් කොට තිබූ ඉවාන් ඉලිච්ගේ කෘති වෙතට ද හැරී ගත්තේ ය. 1970 ගනන්වල දී සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙන් හා කොමියුනිස්ට් පක්ෂයෙන් වඩ වඩා ඉවතට හැරෙමින් පාරිසරික සහ හරිත දේශපාලනයට ප්‍රවිෂ්ට වූ මධ්‍යම පන්තික ස්ථරවලට ඉහත සඳහන් වර්ගයේ "වර්ධනයට සීමා පනවන" න්‍යායක ගම්‍යයන් සමාකලනය කරදීමේ හා සන්ධි කරදීමේ කටයුත්ත සඳහා ගෝස් ඉදිරියට ගියේ ය.

මෙම කාලපරිච්ඡේදයේදී ම ගෝස් ශ්‍රම විභජනය පිලිබඳ තම ආස්ථානය ද මාරු කලේ ය. කාල් මාක්ස්ගේ විශ්ලේෂනය සමග එකපෙලට සිටිමින් තම පූර්ව කෘතිවල දී ශ්‍රම විභජනයත් එහි ප්‍රතිඵලයක් වන පරත්වාරෝපනයත් ධනේශ්වර ක්‍රමය පෙරලා දමා ජයගත යුතු ඓතිහාසිකව ආවශ්‍යක දුෂ්ටත්වයක් බව ගෝස් විස්තර කලේ ය. එහෙත් 1970 ගනන්වල දී ශ්‍රම සන්තතියෙන් පැන නගින පරත්වාරෝපනය වනාහි ඕනෑම සංකීර්න නවීන සමාජයක නො මැකිය හැකි ලක්ෂනයක් යයි ඔහු විස්තර කලේ ය. ගෝස්හට පරත්වාරෝපනය යනු හුදෙක් නිෂ්පාදන සංවිධානයේ ධනේශ්වර රූපාකරය තුල පමනක් නොව නිෂ්පාදනය ක්‍රියාවලිය සාමාජිකකරනය වීම තුල ම නිධන්ගතව පැවතියේ ය.

*ශ්‍රම විභජනය* නම් ඔහුගේ කෘතියේ දී සමාජ පීඩනයේ මූලාශ්‍රය ලෙස ලාභය සඳහා නිෂ්පාදනය සහ නිෂ්පාදන මාධ්‍යවල පුද්ගලික අයිතිය හඳුනාගන්නා මාක්ස්වාදී සංකල්පනාව ගෝස් නිෂ්ප්‍රභාග කරයි. ගෝස්හට මූලික ගැටලුව වන්නේ තාක්ෂනයයි. "නිශ්චිත කාර්මික ශ්‍රම විභජනයක් අනවා සිටින්නේ කම්හලේ තාක්ෂනය විසින් වන අතර එම ශ්‍රම විභජනයට එක්තරා ආකාරයක යටත් වීමක්, ධූරාවලියක් සහ බලහත්කාරයක් අවශ්‍ය කරයි. මේ අනුව බලන කල පැහැදිලිව ම සියල්ලේ අච්චුව සහ අවසාන හේතුව වන්නේ තාක්ෂනය යි" යයි ඔහු ලියයි. ගෝස්ට අනුව නිෂ්පාදනයේ කම්කරු පාලනය කිසිවක් වෙනස් නො කරනු ඇත. සමාජ ප්‍රගතිය නිෂ්පාදන ක්‍රියාවලියට සහ ආර්ථික විද්‍යාවේ විෂයපථයට එපිටින් සොයාගනු ලැබිය යුතු ය.

## කම්කරු පන්තියට ආයුබෝවන්

සමාජය පිලිබඳ මාක්ස්වාදී සංකල්පනය ප්‍රතික්ෂේප කල ගෝස් එහි නො වැලැක්වියහැකි නිගමනය එනම් කම්කරු පන්තියේ බෙලහීනත්වය කරා ඉදිරියට ගියේ ය. ප්‍රංශුවා මිතරොංගේ නායකත්වයෙන් යුත් ප්‍රකොපයේ සහ සමාජවාදී පක්ෂයේ සහාගයක් බලය කරා ආරෝහනය වීමට වසරකට පෙර 1980 දී මාක්ස්වාදී සහ සමාජවාදී අදහස්වලින් තමන්ගේ බිඳී වෙන්වීම අතිශය පැහැදිලිව විග්‍රහ කල කෘතිය වන *කම්කරු පන්තියට ආයුබෝවන්* පල කිරීමට ගෝස් කටයුතු කලේ ය.

ප්‍රංශයේ ද අනෙක් තැන්වල ද සමස්ත රැඩිකල් වාමාංශය සහ බුද්ධි ස්ථරය වෙනසක් සඳහා බලවේගයක් ලෙස කම්කරු පන්තියස සමග යම් හෝ බැඳීමක් තිබුනේනම් එයින් ද අවසාන වසයෙන් බිඳී

වෙන්වීම සඳහා පදනම් වුනු තර්කයන් ගෝස්ගේ මෙම කෘතිය මගින් සම්පාදනය කර දුන්නේ ය.

බටහිර සංවර්ධිත සමාජයන් තුල කාර්මික කම්කරුවන්ගේ සංඛ්‍යාව අඩු වී ඇති බව පෙන්නුම් කල සංඛ්‍යානමය සාක්ෂිවල මතුපිට විශ්ලේෂනය මත පදනම් වෙමින්, සංවිධිත නිෂ්පාදනයේ නිරත කම්කරු පන්තික ස්ථර වරප්‍රසාදිත සුලුතරයක් බවත් සමාජ පරිනාමනයේ දී ඔවුන්ට ප්‍රගතිශීලී කාර්යභාරයක් ඉටුකල නො හැකි බවත් ගෝස් නිගමනය කලේ ය.

තමන්ගේ පූර්ව නිෂ්පාදනය සහ තාක්ෂනය ප්‍රතික්ෂේප කිරීම ඔස්සේ ඉදිරියට යමින් ගෝස් තර්ක කලේ එකම විභව ප්‍රගතිශීලී සමාජ බලවේගය වන්නේ ඵලදායක කාර්යයක නිරත නොවී සිටින අය හෙවත් ඔහු නම්කල පරිදි "කම්කරුවන් නො වන්නන් නො වන පන්තියයි." ගෝස්ට අනුව මෙම ප්‍රවර්ගය රැකියා වියුක්තිකයන් සහ ඌන රැකියා නියුක්තිකයන් වැලඳගත් අතර පරිවර්තිත කොන්දේසි යටතේ ඔවුන්ට විප්ලවවාදී ව්‍යාපෘතියක භූමිකාව ඉටුකල හැකිව තිබිනි. ගෝස් පහත පරිදි පවසන ආකාරයට ද්‍රව්‍යමය සාධකයන්ගෙන් මුලුමනින් ම වියෝ වී සිදුවන සමාජමය පරිවර්තනය පිලිබඳ ඔහුගේ දෘෂ්ටිය විලි ලජ්ජා රහිත ස්වේච්ඡාශීලී ස්වරූපයක් අත්පත් කර ගනී.

"නිදහසේ විජිතය කවර කලෙකවත් ද්‍රව්‍යමය ක්‍රියාවලීන්ගෙන් පැනනැගිය නො හේ. එය ස්ථාපනය කරනු ලැබිය හැක්කේ ස්වකීය නිදහස් ආත්මීයත්වය පිලිබඳ දැනුවත්ව සෑම තනි පුද්ගලයා තුලම නිරපේක්ෂ අවසානය තමන්ව ම තහවුරු වන ස්ථාපක ක්‍රියාවක් ලෙස පමනි. එවැනි ක්‍රියාවක් සඳහා සමර්ථ වන්නේ නිෂපාදනය නො කරන්නන් නො වන පන්තිය පමනි. ඒ මන්ද යත් එය මූර්තිමත් වන්නේ නිෂ්පාදනවාදයට - එනම් සමුච්චය වීමේ සදාචාරය ප්‍රතික්ෂේප කිරීමට සහ සියලු පන්තීන් විසුරුවා මැරීමට- එපිරින් වන හෙයිනි." (74 පිටුව)

කම්කරු පන්තියට ආයුබෝවන් ඉංග්‍රීසියෙන් පලකිරීමෙන් වසරකට පසුව පැවති සම්මුඛ සාකච්ඡාවක දී තමන් විසින් කම්කරු පන්තිය ප්‍රතික්ෂේප කරනු ලැබීම පිලිබඳව ගෝස් වඩාත් තිරසර විය. "මා පෙන්වීමට උත්සාහ දරා ඇති දේවලින් එකක් වන්නේ නිෂ්පාදනයේ හා සමාජයේ පාලනය තමන් අතට ගැනීමට කම්කරු පන්තිය ව්‍යුහාත්මකව අසමත් බවයි." එම සම්මුඛ සාකච්ඡාවේදී ම පසුව එම තේමාවට ගෝස් පෙරලා පැමිනියේ ය. "පශ්චාත්-කාර්මික නව නිර්ධන පාන්තිකයා පැහැදිලිව ම බලය අත්පත් කරගැනීමට අසමත් වන අතර සාම්ප්‍රදායික කම්කරු පන්තිය සම්බන්ධයෙන් ද තත්වය එයයි. බලය අත්පත් කරගැනුම සඳහා ඉදිරිපත් කෙරෙන කවර ම මූලෝපායකට හෝ උපායකට නවීන රාජ්‍යයේ ප්‍රතිවිප්ලවවාදී හැකියාවන්වලට ප්‍රතිරෝධය දැක්විය නො හැකි ය."

ගෝස් විසින් කම්කරු පන්තිය ප්‍රතික්ෂේප කරනු ලැබීම හා සර්ව බලධාරී සෙල්මුවා ස්ථම්භයක් ලෙස රාජ්‍යය විග්‍රහ කරනු ලැබීම අතිමහත් කැදරකමින් යුතුව වැලඳගත් වෘත්තීය සමිති මූලස්ථානවල සහ හරිත ව්‍යාපාරයේ ක්‍රියාකාරීහු ඒ අතර ම ඔහුගේ සංයුක්ත යෝජනා තමන්ගේ වැඩපිලිවෙලවල් තුලට ගලපාගැනීමේ මං සෙවූහ. නව ප්‍රගතිශීලී බලවේගයක් ලෙස රැකියා වියුක්තිකයන්ගේ සහ ඌන රැකියා නියුක්තිකයන්ගේ කුසලතාවලට පක්ෂව කතාකිරීම සමග එකපෙලට සිටිමින් ගෝස් ප්‍රකාශ කලේ නව තාක්ෂනය හඳුන්වාදීම හේතුවෙන් බටහිර ධනේශ්වර රටවල පැනනගින මහජන රැකියා වියුක්තිය ඇත්ත වසයෙන් ම සාදරයෙන් පිලිගතයුතු බවයි. ඔහුට අනුව, තනි පුද්ගලයාගේ ම අවශ්‍යතා සඳහා වැටුප් නොමැතිව කරන ක්‍රියාකාරනම් හෙවත් ඔහු "ස්වාධීන ක්‍රියාකාරීත්වය" හෝ "තමන් වෙනුවෙන් ම වැඩකිරීම" යනාදී අනේකාකාර ලෙසින් නම්කල ක්‍රියාවන් වෙනුවෙන්, වැඩකිරීම "අහෝසි කිරීමට" ලැබෙන ඓතිහාසිකව පෙර නුවූ විරූ අවස්ථාවක් ලෙස, හාම්පුතුන්ට ශ්‍රමය ඉවතලෑමට හැකියාව ලබාදෙමින් සිදුවන නිෂ්පාදන තාක්ෂනයේ විප්ලවය ඩැහැගනු ලැබිය හැකි ය.

උදාහරනයක් ලෙස, නිෂ්පාදන ක්‍රියාවලියෙන් ස්වාධීනව විමුක්තිය ලැබීම පිලිබඳ ඔහුගේ මතය, " සියලු වැඩිහිටි මිනිසුන්ට පූර්න රැකියා නියුක්තිය සමාජීය සහ පාරිසරික ව්‍යසනයක් වනු ඇත" (!) යනුවෙන් ප්‍රකාශකල අයර්ලන්ත හරිතයන්ගේ වැඩපිලිවෙල තුල එල දැරීය.

වඩ වඩා හරිත පක්ෂ විසින් ද පසුව ගෝලීයකරන විරෝධී ඇටැක් ව්‍යාපාරය විසින් ද වැලඳගනු ලැබුනු, මහ ව්‍යාපාර සහ බැංකුවලට ප්‍රති-බලයක් ලෙස කුඩා සහ මධ්‍යම පන්තික ව්‍යාපාර දිරිමත් කිරීම වැනි අනෙකුත් පියවරයන් ද ගෝස් විසින් යෝජනා කෙරුනි. ප්‍රාදේශීය රැකියා වෙලඳ පද්ධතිය (ලෙට් පද්ධතිය) වැනි ප්‍රාදේශීය මුදල් වර්ග භාවිතා කරමින් භාන්ඩ හා සේවා හුවමාරු කරගන්නා ව්‍යාපාරික සහ තනි පුද්ගල ප්‍රජාවන්ගේ ලාභ නො ලබන සමාගම් වැනි ආරම්භකත්වයන් කෙරෙහි ගෝස්ගේ උද්යෝගය පල විය. ඔහුට අනුව, "ප්‍රාදේශීය මුදල් වර්ග, මූල්‍ය වන්දනය අහෝසි කරමින් ද අවශ්‍යතා සහ නාස්තියෙන් වැලකීම දිරිගැන්වීම පිලිබිඹු කරමින් වෙලඳමේ යෙදීම ද" නිසා ඉහත වර්ගයේ කුඩා ව්‍යාපාරවලට ගෝලීය ප්‍රාග්ධනයේ බලය පැහැරගැනීමට උපකාරී විය හැකි ය.

*කම්කරු පන්තියට ආයුබෝවන්* තුල කම්කරු පන්තිය නො තකා හරින අතර ම විවේක කාලය ඉතා හොඳින් ප්‍රයෝජනයට ගැනීම පිනිස "පරිකල්පනික" අදහස්වලට තැනදීම සඳහා වැඩ මත පදනම් වූ සමාජය අහෝසි කිරීම ඉලක්ක කරගත්, නො පැහැදිලි ලෙස නිර්වචනය කරන ලද

"සමාජ ව්‍යාපාර" සමග ඒකාබද්ධ වූ නව වෘත්තීය සමිති වර්ගයක් සඳහා කැඳවුම් කරමින් ඔහු එක දිගට ම සමාජ අරගලවල දී වෘත්තීය සමිතිවල භූමිකාව උත්කර්ෂනය කිරීමේ යෙදුනේ ය. කෙටි වැඩ සතියක් සඳහා හෝ විශ්වීය සමාජ වැටුපක් සඳහා ගෙනයන තම උද්ඝෝෂනවල දී ගෝස්ගේ තර්ක විතර්ක බොහොමයක් භාවිතයට ගත් ඉතාලියේ, ජර්මනියේ හා ප්‍රංශයේ වෘත්තීය සමිති ව්‍යාපාර විසින් ඔහුගේ මත වැලඳ ගනු ලැබීමට නියමිත විය.

## ගෝස්ගේ 'සමාජවාදී යුතෝපියාව' මුහුදුබත් වීම

*පාරාදීසයට මාවත, ආර්ථික තර්කය පිලිබඳ විවේචනය සහ ධනවාදය, සමාජවාදය සහ පරිසරවේදය* යන තම පසුකාලීන රචනා තුල ගෝස් නො කඩවා ඔහුගේ යෝජනා සමාජවාදී කඩතුරාවෙන් ආවරනය කල අතර ම තම ව්‍යාපෘතියේ මනෝරාජික (යුතෝපියානු) ස්වභාවය ව්‍යංගයෙන් අවධාරනය කලේ ය.

"සමාජවාදී යුතෝපියාවේ සදාචාරාත්මක අන්තර්ගතය යන දෙය ආරක්ෂා කරගැනීමට නම් අපට නව යුතෝපියාවක් අවශ්‍ය ය. තනි පුද්ගලයන්ගේ විමුක්තිය, ඔවුන්ගේ පරිපූර්න වර්ධනය, සමාජය ප්‍රතිව්‍යුහගත කිරීම යනාදී සියල්ල කරා ලඟාවනු ඇත්තේ වැඩකිරීමෙන් මිදීමෙනි." (*ආර්ථික තර්කය පිලිබඳ විවේචනය*, 1989)

නිෂ්පාදනයෙන් සහ පරිභෝජනවාදයෙන් වෙන් වූ තනි පුද්ගල නිදහස මත පදනම් වූ

"සමාජවාදී යුතෝපියාව" වෙනුවෙන් ගෝස් කතා කිරීම, ජර්මානු-ඇමරිකානු න්‍යායඥ හර්බට් මාකුස් මෙන් ම සිග්මන්ට් බවුමන් වැනි සමකාලීන බොහෝ න්‍යායඥයන්ගේ ලියවිලි යලි මතකයට නංවයි. ඇත්ත වසයෙන් ම ගෝස්ගේ "යුතෝපියාව" ප්‍රත්‍යක්ෂයක් බවට පත්කර ගැනීමේ කර්තව්‍යය ජර්මනියේ අයිජී මෙටල් සහ ප්‍රංශයේ ප්‍රංශ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු සම්මේලනය වැනි සංවිධානවල කෙරාටික වෘත්තීය සමිති නිලධරයන්ගේ අතට පත් විය.

1984 දී සති හතක වැඩ වර්ජනයකින් පසුව කර්මාන්තයේ වැඩකරන තමන්ගේ බොහෝ සාමාජිකයින්ට පැය 35 වැඩ සතියක් සාර්ථකව ක්‍රියාවට දමා ගැනීමට අයිජී මෙටල් සමිතිය සමත් විය. ජර්මනියේ කම්කරුවන් වඩා හොඳ වැටුප් සහ සේවා කොන්දේසි සඳහා කරන ලද අරගල මාලාවකින් අනතුරුව වැඩ වර්ජනය පැමිනි අතර හැත්තෑ ගනන් අග සහ අසූ ගනන් මුල භාගයේ එක් තරා කෙටි කාල සීමාවකට ගෝසගේ උත්සාහයන් සමහර කම්කරු ස්ථරවලට අවංකව ම ප්‍රතිඵලදායක යයි පෙනී ගියේ ය. එහෙත් මහා බ්‍රිතාන්‍යයේ මාග්‍රට් තැචර් හා ඇමරිකාවේ රොනල්ඩ් රීගන් වැන්නන් හරහා එල්ල කෙරුනු ධනේශ්වර ප්‍රතිප්‍රහාරය මධ්‍යයේ පෘථුල ප්‍රතිසංස්කරන දිනාගැනීමේ හැකියාව අවසානයේ මුහුදුබත් විය.

"වැඩවලින් විමුක්ත වීම" සඳහා වූ ගෝස්ගේ යෝජනා සැමවිටම ප්‍රසාරනය වන සුභසාධක රාජ්‍යයක් පූර්වකල්පනය කිරීම මත පදනම් විය. එහෙත් 1970 ගනන්වල පලමුවරට වර්ධනය කෙරුනු මුලුමනින් ම නව්‍ය තාක්ෂනයන් මත පදනම් වූ නිෂ්පාදනයේ භුගෝලීයකරනයේ වේගවත්වන ක්‍රියාවලිය ජාතික සහන ලබාදීම සහ සුභසාධක රාජ්‍යයක් ප්‍රසාරනය වීම යන ඒවාට තිබූ හැකියාව ඉවත් කර දැමී ය. එක් රටකින් පසු අනෙක වසයෙන් සෑම රටක ම ව්‍යාපාරික සහ දේශපාලන ප්‍රභූව පවත්නා සමාජ ජයග්‍රහන විනාශ කිරීමටත් කම්කරුවන්ගේ වැටුප් සහ සේවා කොන්දේසි මත ප්‍රහාර එල්ල කිරීමටත් ක්‍රමානුකූල උද්ඝෝෂනයක් ඇරඹීය.

1981 දී තෝරා පත්කර ගැනුනු ප්‍රකොපයේ ඇමතිවරුන් හතර දෙනෙක් ද ඇතුලත් වූ ප්‍රංශුවා මිතරොංගේ වාමාංශික ආන්ඩුව වහා වෙලඳපොල පීඩනයට යටත් වූයේ, තමන්ගේ ම

"විප්ලවවාදී ප්‍රතිසංස්කරන" වැඩපිලිවෙල අතහැර දමා කම්කරු පන්තිය මත ක්‍රමානුකූල ප්‍රහාරවල ව්‍යාපාරයක් ඇරඹීය.

ජර්මනිය තුල, කෙටි වැඩ සතියක් අරබයා අයිජී මෙටල් එලැඹුනු ගිවිසුම කම්කරුවන්ට කිසිදු කල් පවතින ප්‍රතිලාභයක් ගෙන දීමට අසමත් විය. ඒ වෙනුවට නිලධරයන් කලේ "වැඩ ලෝකයේ වෙනස්කම්වලට අනුවර්තනය වීම" සහ "වෙනස් වැඩ අපේක්ෂාවන් සහිත නව සමාජ ස්ථරවල" ඉස්මතු වීම යනාදී ගෝස් විසින් වර්ධනය කරන ලද තර්ක මත පදනම්ව හාම්පුතුන්ට ලබාදුන් සහන සාධාරනීකරනය කිරීමයි. අදායම්වල අනුරූපී වැඩිවීමකින් තොරව කලමනාකරනයන් විසින් ශ්‍රම බලකාය තුල ආයතනගත කරන ලද වැඩි දියුනු නම්‍යශීලීත්වයේ පදනම් බවට වෘත්තීය සමිති විසින් එලැඹුනු ගිවිසුම් වඩ වඩාත් පත් විය. නම්‍යශීලී වැඩමුර සහ කලින් පැවතුනු ආකාරවල ගිවිසුම්ගත සුරක්ෂිතතාවය විනාශ කිරීම මත පදනම් වූ අඩු වැටුප් ශ්‍රම රූපාකාරවලට ඉඩ ලබා දෙමින්, ප්‍රමානවත් වැටුපක් සහිත පූර්න කාලීන

රැකියාවක් යන සාම්ප්‍රදායික සංකල්පය බිඳ දැමීමට කලමනාකරනයට අවසර ලබා දෙන මූලික අවයවයක් බවට, කෙටි වැඩ සති ගිවිසුම් භාවිතයේ දී පත්ව තිබුනි.

අයිජී මෙටල් සමිතිය වර්තමානයේ දී ප්‍රධාන සමාගම් කිහිපයක ම 40පැයේ වැඩ සතිය පුනස්ථාපනය කිරීමේ මාවත් සොයමින් සිටී. උදාහරනයක් ලෙස 2004 දී සීමන්ස් සමාගම දැක්විය හැක. ඊට අමතරව මෑතකාලීන සංඛ්‍යාලේඛන අනාවරනය කොට ඇත්තේ, විශාල වසයෙන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී- හරිත පක්ෂ සභාගයක පාලනය ආධිපත්‍යය දැරූ 1998 සිට 2007 දක්වා කාල සීමාව අතරතුර, ප්‍රධාන සමාගම්වල ලාභ සහ කලමනාකරුවන්ගේ වේතන හැල්මේ ඉහල යද්දී ජර්මානු කම්කරුවන්ගේ වැටුප් එකතැන පල් වෙමින් පැවත ඇති බවයි. දශක හතරක් පුරා රැඩිකල් ප්‍රතිසංස්කරන වැඩපිලිවෙලකට යලි යලිත් අලුත් හුස්මක් පිඹීමට ගෝස් දැරූ ප්‍රයත්නවලට, ඉතිහාසය කෙටි දශක ගනනක කාලපරාසයක් තුල තම කර්කශ තීන්දුව ලබා දී ඇත.

ශත වර්ෂ දෙකකට පෙර විද්‍යාත්මක සමාජවාදයේ ආරම්භකයන් වූ කාල් මාක්ස් සහ ෆ්‍රෙඩ්රික් එංගල්ස්, පූර්ව මනෝරාජික සමාජවාදීනගේ සීමිත සංකල්පනයන් "සාරසංග්‍රහවාදී, පහල මට්ටමේ සමාජවාදයක්" නියෝජනය කරන බවත් ඒවා " අච්චාරුවක්" බවත් ප්‍රකාශ කරමින් ඒ පිලිබඳ තමන්ගේ ම කර්කශ විවේචනය ප්‍රකාශයට පත් කලහ. වර්තමානයේ දී කම්කරු පන්තිය ප්‍රතික්ෂේප කරනු ලැබීම මත පදනම්වන ගෝස්ගේ අසාර්ථක යුතෝපියානු ප්‍රතිපත්තිවල "සාරසංග්‍රහවාදී අච්චාරුව", දැන් යුරෝපීය ආන්ඩු ගනනාවක ම අමාත්‍ය තනතුරු දරමින් මහා ව්‍යාපාරිකය සහ ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් අත්‍යන්ත ප්‍රතිගාමී සමාජ ප්‍රතිපත්ති ක්‍රියාවට දමමින් සිටින, බොහෝ හිටපු රැඩිකලුන් ද ඇතුලත් සුලු ධනේශ්වරයේ සහ වෘත්තීය සමිති නිලධරයේ ස්ථරයන්ට දේශපාලන කවරයක් ලෙස සේවය කරයි.

© www.wsws.org